# ශ්‍රී ලංකාවේ
# විසම්මුතිය මර්දනය

ජූලි - සැප්තැම්බර් 2015



ශ්‍රී ලංකාවෙහි වගවීමේ සිදුවීම් සඳහා අන්තර් ජාතික යාන්ත්‍රණයක් ඉල්ලා පැවති අත්සන් ව්‍යාපාරය පොලීසියේ විවිධ හිරිහැර වලට බඳුන් විය. දෙමළ කතෝලික රදගුරුවරයකු විසින් පෙත්සම අත්සන් කරන අයුරු ඡායාරූපයේ දැක්වේ. (ඡායාරූපය ගජේන් පොන්නම්බලම් ගේ ට්විටර් පණිවුඩයකිනි)


INFORM Human Rights Documentation Centre

www.ihrdc.wordpress.com informcolombo@gmail.com

## ආවරණය කළ සිදුවීම්

**A. මානව හිමිකම් ආරක්ෂකයින් වෙත මරණ තර්ජන**

**B. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝනය වීම්**

**C. රැස්වීමේ නිදහස උල්ලංඝනය වීම්**

ඉන්ෆෝම් ආයතනය 1990 දී ආරම්භ කරන ලද්දේ විශේෂයෙන් ම වාර්ගික ගැටුම සහ යුද්ධය සන්දර්භයෙ හි ශ්‍රීලංකා වේ මානව හිමිකම් තත්ත්වය නිරීක්ෂණය කරමින් කරුණු ගොනු කිරීමටත් එම කරුණු ලිඛිත සහ වාචික මැදිහත් වීම් හරහා ප්‍රාදේශීයව, ජාතිකව සහ ජාත්‍යන්තරව වාර්තා කිරීමටත් ය. එසේම සිය අයිතීන් නිරන්තරයෙන් සහ ක්‍රමවත් ලෙස කෙලෙසීමට ලක්වන අනෙක්ජන ප්‍රජාවන් සමග ද ඉන්ෆෝම් ආයතනය කටයුතු කරයි. වර්තමානයේ දී ඉන්ෆෝම් ආයතනය මැතිවරණ නිරීක්ෂණය,මාධ්‍ය නිදහස සහ මානව හිමිකම් ආරක්ෂකයින් සම්බන්ධයෙන් සිය අවධානය යොමු කර තිබේ. ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටා ඇති ඉන්ෆෝම් ආයතනය දේශීය ක්‍රියාධරයින්, කණ්ඩායම් සහ ජාලයන් සමඟ මෙන්ම කලාපීය සහ ජාතයන්තර මානව හිමිකම් ජාලයන් සමග සහයෝගයෙන් කටයුතු කරයි.

## සාරාංශය :

වාර්තාවට අදාල මාස තුනක කාලය ඉතාම වැදගත් සිදුවීම් දෙකකින් සමන්විත වේ. එනම්, අගෝස්තු 17 වන දින පැවති පාර්ලිමේන්තු මැතිවරණය සහ සැප්තැම්බර් - ඔක්තෝබර් මාස වල ජිනීවා හි පැවති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 30 වන සැසි වාරය හා සම්බන්ධ සිදුවීම්ය.

මහා මැතිවරණයේදී හිටපු ජනාධිපතිවරයගේ පරාජය නැවත වරක් තහවුරු කරමින් එක්සත් ජාතික පක්ෂය ප්‍රධානත්වය ගනු ලැබූ පෙරමුණ බලයට පැමිණියේය. මෙම ආණ්ඩු පෙරලිය ශ්‍රී ලංකාවේ වඩා ප්‍රජාතන්තාවාදී පාලනයක් සඳහා වන අත්තිවාරමක් ලෙස බොහෝ දෙනා හඳුනා ගත්හ.

ඉන්ෆෝම් කොටස්කාරීත්වය දරන මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා 856ක් වාර්තා කළ අතර ඉන් 146ක් බරපතල සිදු වීම්ය. ඒ අතර මිනී මැරුම් 4ක් ද විය. 2010 මහා මැතිවරණයේදී වාර්තා වූ සිදුවීම් ගණන 414ක් වූ අතර ඉන් 232ක්ම බරපතල ගනයේ සිදුවීම් විය. මෙම මැතිවරණයේදී ප්‍රචණ්ඩක්‍රියා සිදුවීම් ගණන ඉහළ ගොස් තිබුණද බලපතල සිදුවීම් සංඛ්‍යාව පහළ ගොස් තිබුණි. මෙම සන්දර්භය තේරුම් ගත යුත්තේ පශ්චාත් යුධ සමයේ ගතිකත්වයන් ද සමගිනි. එනම් පසුගිය රජය යටතේ එක් අතකින් රාජ්‍ය වාරණය සහ තවත් අතින් රාජ්‍ය අනුග්‍රහය ඇතිව, ජාතිකවාදී සහ ජාතිවාදී මතවාදයන් ජනප්‍රිය කර තිබීමයි. ආණ්ඩු පෙරළියක් සිදු වුවද පෙර ආණ්ඩුවේ සිටි බොහෝ දෙනා නව ආණ්ඩුවට සහය පල කරමින් ඒ හා එක් විය.

ශ්‍රී ලංකාවේ නව රජය විසින් කරල ලද ඉල්ලීමකට අනුව කල් දමන ලද 2015 මාර්තු මාසයේදී එළි දුක්වීමට නියමිතව තිබූ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය සහ එමගින් ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලැබූ පරීක්ෂණ පිළිබඳ වාර්තාව සැප්තැම්බර් මස 16 වන දින එළි දක්වන ලදී. යුද්ධයේ දී දෙපාර්ශවය විසින්ම කරන ලද පුළුල්ව පැවති ක්‍රමානුකූල අපයෝජනයන්, 2015 වර්ශයේදීත් නොකඩවා පැවති හිංසන , පුළුල්ව පැවති දණ්ඩ මුක්තිය ( දඩුවම් නොලබන සංස්කෘතියක්) සහ රජය තුළ ධානාත්මක වෙනස් කම් සිදු වී තිබුණත් ශ්‍රී ලංකාවේ පවතින අපරාධ නීතිය සහ අධිකරණය වගවීම සහතික කිරීමට අපොහොසත් වී ඇති බව මෙම වාර්තා විසින් ඉස්මතු කරන ලදී. එමනිසා, අන්තර්ජාතික විනිශ්චකරුවන්, පැමිණිළි මෙහෙයවන්නන් ( අභියෝජකයින්) , නීතීඥවරුන් සහ පරීක්ෂකයන් ගෙන් සමන්විත විශේෂ දෙමුහුන් අධිකරණයක් සඳහා වූ නිර්දේශය ඉස්මතු කළ කරුණු අතර ප්‍රධාන විය. මානව හිමිකම් කවුන්සිලය විසින් එකගතා යෝජනාවක් සම්මත කර ගන්නා ලද අතර ශ්‍රී ලංකාව එහි සම අනුග්‍රහයකයෙකු විය. මෙම යෝජනාවේ ස්වරූපය ශ්‍රී ලංකා නව රජය සතුටු කරවන ආකාරයේ එකක් වූ අතර එහිදී මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය විසින් ශ්‍රී ලංකාව පිළිබඳ සිදු කළ පරීක්ෂණයේ වාර්තාවේ සඳහන් බරපලත චෝදනා පිළිබඳ වැඩි අවධානයක් නොදක්වන ලදී. දෙමුහුන් අධිකරණයක් ස්ථාපිත කිරීම පිළිබඳ වූ නිර්දේශ පිළිබඳ සාකච්ඡාව තරමක් ව්‍යාකූල අන්දමින් නිමා වුවද මෙම යෝජනාව තුළ මානව හිමිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයට විශාල කැපවීමක් ඇතුළත් විය.

මෙතෙක් කල් සිදු වූ පරිද්දෙන්ම විසම්මුතිය මර්දනය කිරීමේ සිදුවීම් විශේෂයෙන්ම උතුරු නැගෙනහිර පළාත් වලින් නොකඩවාම වාර්තා විය. නමුත් සිදුවීම් සංඛ්‍යාව සහ ඒවායේ තීව්‍ර තාවය 2014 සහ ඊට පෙර වර්ෂ වලට වඩා පහළ ගොස් ඇත. මේ කාලය තුළ මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ ගේ අතුරුදහන් වීම පිළිබඳ තොරතුරු හෙළිකර ගන්නා ලද ඒ සම්බන්ධයෙන් ආරක්ෂක සේවා නිලධාරීන් කිහිප දෙනෙක්ද අත්අඩංගුවට ගන්නා ලදී. කෙසේ වුවත් පසුගිය වසර වල සිදු වූ විසම්මුතිය මර්දනය හා සම්බන්ධ බොහෝ සිදුවීම් සම්බන්ධයෙන් පරීක්ෂණ, චෝදනා ඉදිරිපත් කිරීම සහ දඩුවම් නියම කිරීම් සම්බන්දයෙන් ප්‍රගතියක් තවමත් දක්නට නොමැත.

## A. මානව හිමිකම් ආරක්ෂකයින්ට මරණ තර්ජන

### 1. මානව හිමිකම් ආරක්ෂකයෙකු වන දෙමල ජාතික කාන්තාවකට ලිංගික කෙළෙසීමේ සහ මරණ තර්ජන




*තවපානල් පිරියතර්සිනී*

මන්නාරම බටහිර දිසාවේ මාන්තෛහි ඉලුප්පායික්-කාඩවායි සමීපයේ පිහිටා ඇති තීත්තා-වාඩි නැමති ගමේ කාන්තා සංවර්ධන සමාජය නම් සංවිධානයේ ප්‍රධානියා වන 47 වියැති තවපාලන් පිරියාතර්සිනී, තමාට සහ සිය දියණියන් තිදෙනාට නාඳුනන කණ්ඩායමක් විසින් මරණ තර්ජන එල්ල කළ බව ප්‍රකාශ කර තිබුණි. සුදු පැහැති වෑනි රථයකින් අගෝස්තු 11 වන දින ඇගේ නිවසරට පැමිණි නාඳුනන පිරිමින් කණ්ඩායමක් විසින් ඇය තව දුරටත් ගම් වැසියන්ට නායකත්වය දුන්නොත් ඇය දූෂණය කර සහ මරා දමන බවට තර්ජනය කර ඇත.
http://www.tamilnet.com/art.html?catid=13&artid=37886

## B. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝනය කිරීම්

### 2. ශ්‍රී ලංකා ගුරු සංගමයේ සභාපති වරයාට පහරදීම

2015 සැප්තැම්බර් 30 වන දින අනුරාධපුර කලාප අධ්‍යාපන කාර්යාලයට සම්බන්ධ නිලධාරියෙකු විසින් සිය සංගමයේ සභාපති වරයා වන ප්‍රියන්ත ප්‍රනාන්දු මහතාට පහර දී ඇති බව ශ්‍රී ලංකා ගුරු සංගමය වාර්තා කර ඇත. මේ පහරදීම සිදු කර ඇත්තේ ප්‍රනාන්දු මහතා එහි පැවති රැස්වීමක් සඳහා සහභාගී වීමට ගිය අවස්ථාවකදීය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ පත්වීම විධිමත් කිරීම සඳහා සිය සංගමය විසින් ගෙන යන අධිවාචන වැඩපිළිවෙළ මෙම පහර දීමට හේතු වන්නට ඇතැයි ශ්‍රී ලංකා ගුරු සංගමය විශ්වාස කරයි.

( උතුරු මැද පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයා වෙත ශ්‍රී ලංකා ගුරු සංගමය විසින් යවන ලද ලිපියකින් උපුටා ගෙන ඇත.)

### 3. ජනමාධ්‍යවේදීන්ට පහර දීම්

මහජන රැස්වීමක ප්‍රදර්ශනය කර තිබූ විකෘති කරන ලද ජාතික කොඩි ඡායාරූපගත කරමින් සිටි ජනමාධ්‍යවේදීන් පිරිසකට හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ ආරක්ෂකයින් පිරිසක් විසින් පහර දී ඔවුන්ව බලෙන් රඳවා තබා

ගෙන ඇත. මෙම රැස්වීමේ ප්‍රධාන කථිකයා වී ඇත්තේ රාජපක්ෂ මහතාය. ආරක්ෂක නිලධාරීන් විසින් ජනමාධ්‍යවේදීන්ගේ කැමරාද උදුරාගෙන ඇත. කැමරා නැවත භාර දී ජනමාධ්‍ය වේදීන් නිදහස් කරන ලද්දේ අදාල රැස්වීමේ සංවිධායකයින් විසින් ප්‍රදර්ශනය කර තිබූ විකෘති කරන ලද ජාතික කොඩි ඉවත් කිරීමෙන් පසුවය. මෙම සිදුවීම හටගෙන ඇත්තේ 2015 ජූලි 27 වන දිනය.

http://www.lankadeepa.lk/index.php/top_story/335695

## C. රැස්වීමේ නිදහස උල්ලංඝණය කිරීම

### 4. ත්‍රිකුණාමලයේදී ශ්‍රී ලංකා පොලීසිය විසින් අත්සන් ව්‍යාපාරය අතරමග නවත්වයි.



*බිය ගැන්වීම් නොසලකා අත්සන් ව්‍යාපාරය දිගටම පවත්වාගෙන යන ලදී. (ඡායාරූපය - Tamil Guardian)*

ශ්‍රී ලංකාවේ පැවති ආයුධ සන්නද්ධ ජනවාර්ගික ගැටුමේ අවසන් අදියරේදී සිදු කරන ලදැයි සැලකෙන කෘරකම් සම්බන්ධයෙන් අන්තර් ජාතික වශයෙන් වගවීමේ යාන්ත්‍රණයක් ඉල්ලා ගෙන ගිය අත්සන් ව්‍යාපාරයේ සංවිධායකයන්ව 2015 සැප්තැම්බර් 07 වන දින ත්‍රිකුණාමල පොලීසියට කැඳවා ඇත. ත්‍රිකුණාමලයේදී බලෙන් අත්සන් ලබා ගත් බවට ඇති වාර්තා සම්බන්ධයෙන් ප්‍රධාන පොලිස් අධිකාරීවරයාව හමු වන ලෙස සංවිධායක වරුන්ට පොලීසිය විසින් දැනුම් දී ඇත. මෙම අත්සන් ව්‍යාපාරය ශ්‍රී ලංකා පොලීසියේ මාධ්‍ය ඒකකය මගින් රූප ගත කළ බවත්, කිසිම කෙනෙකුගෙන් බලෙන් අත්සන් ලබා නොගත් බව ඉන් ඔප්පු වන බවත් දෙමළ ජාතික මහජන පෙරමුණේ සභාපතිවරයා ට්විටර් පණිවුඩයක සඳහන් කර තිබුණි.

http://www.tamilguardian.com/article.asp?articleid=15831

## 5. අත්සන් ව්‍යාපාරය නවත්වා දැමීමට ශ්‍රී ලංකා පොලීසිය යාපනයේදී උත්සහ දරයි.

ශ්‍රී ලංකාවේ පැවති ආයුධ සන්නද්ධ ජනවාර්ගික ගැටුමේ අවසන් අදියරේ දී සිදු කරන ලදැයි සැලකෙන දෙමල සිවිල් වැසියන් දස දහස් ගණනක් මරා දමන ලදැයි ඇති චෝදනාවට අදාල කාරකම් සම්බන්ධයෙන් අන්තර් ජාතික වශයෙන් වගවීමේ යාන්ත්‍රණයක් ඉල්ලා යාපනයේදී ගෙන ගිය අත්සන් ව්‍යාපාරය නවතා දැමීමට ශ්‍රී ලංකා පොලීසිය විසින් උත්සහ ගෙන ඇති බව වාර්තා විය. ක්‍රම ක්‍රමයෙන් රැස් වූ පොලිස් නිලධාරීන් විසින් අත්සන් ව්‍යාපාරය නවතා දැමීමට නියෝග කළ බව දෙමල ජාතික මහජන පෙරමුණේ සභාපති ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් ට්විටර් පණිවුඩයක සඳහන් කර තිබුණි.

http://www.tamilguardian.com/article.asp?articleid=15804




*යාපනයේ අත්සන් ව්‍යාපාරය පිළිබඳ ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් ගේ ට්විටර් පණිවුඩය*